සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

07 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 33 S I

**ඉතිහාසය I** | කාලය පැය දෙකයි

සැලකිය යුතුයි :- • සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
• අංක 1-5 දක්වා ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. මහා වංශයේ සඳහන් වන පරිදි පණ්ඩුකාභය කුමාරයා ළමා කාලය ගත කර ඇත්තේ
   (i) අනුරාධපුරයේයි. (ii) මාගමයි. (iii) දොරමඬලාවයි. (iv) පොළොන්නරුවයි.
2. ශ්‍රී ලංකාව තැප්‍රොබේන් නමින් හැඳින්වූ ශිෂ්ඨාචාරය කුමක්ද?
   (i) ග්‍රීක් ශිෂ්ටාචාරය. (ii) රෝම ශිෂ්ටාචාරය.
   (iii) මොසපොතේමියානු ශිෂ්ඨාචාරය. (iv) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය.
3. ''මින්නේරි දෙවියන්'' ලෙස හඳුන්වන ලද රජතුමා වන්නේ,
   (i) වසභ රජුය. (ii) මහසෙන් රජුය. (iii) ධාතුසේන රජුය. (iv) කාශ්‍යප රජුය.
4. දකුණු ඉන්දියාවේ පිහිටි පල්ලව රාජධානියේ අගනගරය වන්නේ,
   (i) මදුරා පුරයයි. (ii) තන්ජෝරය. (iii) දිල්ලිය. (iv) කාංචිපුරය.
5. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් පිදුම් ලැබූ රජතුමා වන්නේ,
   (i) තුන්වන විජය බාහු රජුය. (ii) දෙවන පරාක්‍රමබාහු රජුය.
   (iii) දෙවන බුවනෙකබාහු රජුය. (iv) හයවන පරාක්‍රමබාහු රජුය.

* **අංක 6 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් යොදන්න.**

6. සපුමල් කුමාරයා යාපනය ප්‍රදේශයේ යටත් කරගැනීම ( )
7. ශ්‍රී ලංකාවෙන් ලෝක උරුම පහක් දායාද කර ඇත. ( )
8. සාලිය කුමරුගේ බිරිඳ අශෝකමාලා රසවත් ලෙස ආහාර පිසූ බව සහස්ස වත්ථුපකරණයේ සඳහන් වේ. ( )
9. පළමු විජයබාහු රජතුමා අනුරාධපුරයේ රජ මාළිගයක් ඉදිකිරීම ( )
10. හතර වන උදය රජතුමා බදුලු ටැම් ලිපිය කරවන ලදි. ( )

.* **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු වරහන තුළින් තෝරා ලියන්න.**

(පුග, පළමු පරාක්‍රමබාහු රජු, සුරනිමල, ''නිගම'' පළමු විජය බාහු රජු, ගෝඨයිම්බර, ග්‍රීක් ශිෂ්ටාචාර, රෝම ශිෂ්ටාචාර, සීගිරිය, ටජ්මහල්)

11. මාගම සිට පැමිණි ............................................................ යෝධයා අනුරාධපුර පිහිටි වෙළඳසැලකින් සුවඳ විලවුන් ගැනීම
12. අතීත ශ්‍රී ලංකාවේ පැවති වෙළඳ සංවිධාන ........................................................ නමින් හඳුන්වයි.
13. ...................................................... රජතුමා සුතිඝර චෛත්‍ය ඉදිකර ඇත.
14. ඔලිම්පික් ක්‍රීඩාව ........................................................ ශිෂ්ටාචාරයෙන් වර්තමාන ලොවට ලැබුණු දායාදයකි.
15. අටවන ලෝක පුදුමය ලෙස .................................................... නම් කර ඇත.

* **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට A හා B තීරු නිවැරදිව ලෙස ගලපා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 16. | ලයිසියම් ආයතනය නිර්මාතෘ | A සුබ සෙනෙවි |
| 17. | යාපහුව බලකොටුව තැනූ පුද්ගලයා | B අනුරාධපුර |
| 18. | උඩරට ප්‍රාදේශීය පාලකයෙක් | C ඇරිස්ටෝටල් |
| 19. | මන්නාරම හඳුන්වන පැරණි නාමය | D මාතොට |
| 20. | පස්වන මිහිඳු රජු රාජ්‍ය කළ රාජධානිය වන්නේ | E ජෝතිය සිටු |

(ලකුණු 20 x 2 - 40)

## II පත්‍රය

⋆ සැලකිය යුතුයි :- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

1. (අ) ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.
   (පොළොන්නරුව/ යාපහුව/ මහවැලි ගඟ/ මිනිපේ ගංදෙනිය බලකොටුව/ කෝට්ටේ)
   (ආ) සපයා ඇති ලෝක සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කරන්න.
   (කළු මුහුද, ඉතාලිය, ඉන්දියාව, ස්පාර්ටා, එංගලන්තය) (ලකුණු 10)
   (ඉ) පහත සඳහන් රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
   A) (i) මෙම රූපයේ දැක්වෙන ස්ථානය කුමක්ද?
   (ii) මෙම ස්ථානයේ සිදු වූ වැදගත් සිදුවීම කුමක්ද?
   (iii) මෙම රූප සටහන කුමන රජු හා සම්බන්ධවේද?



   B) (i) මෙම රූපයේ දැක්වෙන පුද්ගලයා කවුද?
   (ii) මොහු කුමන අධිරාජ්‍යයක පාලකයාද?
   (iii) මෙම යුගයේ පෙරුසලම වැදගත් වූයේ ඇයි?



   C) A) අලුතින් ගිනිතබා සකස් කරගත් හේනට කියන නම කුමක්ද2
   B) ශ්‍රී ලංකාවේ වෙස්මූණු සඳහා ප්‍රසිද්ධ නගරය කුමක්ද? (ලකුණු 10)

2. (i) ගොවිතැනේදී යොදා ගන්නා උපකරණ 02 ක් ලියන්න. (ලකුණු 02)
   (ii) පැරණි සමාජයේ ගවයන් ලබා දුන් පෝෂණ ද්‍රව්‍ය 03 ලියන්න.
   (iii) අතීත ලංකාව තුළ වෙළඳාම සිදු වූ ආකාරය කරුණු 2 ක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

3. (i) අනුරාධපුර මුල් භාගයේ රජවරු දෙදෙනෙකුගේ නම් ලියන්න (ලකුණු 02)
   (ii) අනුරාධපුර යුගයේ දක්නට තිබූ නීති වර්ග 03 ලියන්න (ලකුණු 03)
   (iii) පළමු පරාක්‍රමබාහු රජතුමාගේ සේවාවන් පිළිබඳ කරුණු දෙකක් ඇසුරෙන් ලියන්න. (ලකුණු 05)

4. (i) අපේ සංස්කෘතික උත්සව වලට නිදසුන් 02 ක් ලියන්න.(ලකුණු 02)
   (ii) ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක උරුම ස්ථාන 03 ක් ලියන්න. (ලකුණු 03)
   (iii) අපේ සංස්කෘතික උරුම රැකගත යුත්තේ ඇයිදැයි කරුණු 2 ක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

5. (i) අතීත ශ්‍රී ලංකාව තුළ වරින් වර රාජධානි බිහිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)
   (ii) කුරුණෑගල රාජධානි සමයේ බිහි වූ සාහිත්‍ය කෘති 3 ක් ලියන්න (ලකුණු 03)
   (iii) දෙවන පරාක්‍රමබාහු රජතුමා මුහුණදුන් අභියෝග 2 ක් විස්තර කරන්න. (ලකුණු 05)

6. (i) ග්‍රීක ශිෂ්ටාචාරයේ ක්‍රීඩා වලට නිදසුන් 3 ක් ලියන්න
   (ii) ග්‍රීක ශිෂ්ටාචාරයේ සිටි දාර්ශනිකයින් තිදෙනෙක් ලියන්න
   (iii) රෝම ශිෂ්ටාචාරයේ
   (i) නගර නිර්මාණ
   (ii) ලොවට උරුම කල දායාද
   යන මාතෘකා පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
# ඉතිහාසය - පිළිතුරු පත්‍රය

**07 ශ්‍රේණිය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | (iii) | 2. | (i) | 3. | (ii) | 4. | (iv) | 5. | (ii) |
| 6. | √ | 7. | × | 8. | × | 9. | √ | 10. | √ |

11. (සුරනිමල) 12. ( පුග ) 13. (I පරාක්‍රමබාහු රජු)
14. (ග්‍රීක ශිෂ්ඨාචාරය 15. (සීගිරිය) 16. (ඇරිස්ටෝටල්)
17. A 18. E 19. D 20. B

## II කොටස

(01) A)(i) බෙලිගල.
(ii) දන්ත ධාතු පාත්‍රා ධාතු තැන්පත් කිරීම.
(iii) තුන්වන විජයබාහු.
A- නවදැලි හේන.
B- අම්බන්තොට - උඩුවිල.

B)(i) ඔගස්ටින් ඩීසර.
(ii) රෝම.
(iii) ජේසු උපත.

2.(i) නගුල/පෝරු/දැකැති.
(ii) කිරි/ දී කිරි/ මෝරු/ ගිතෙල්.
(iii) ● රට තුළ වෙළඳාම ●රට පිටත වෙළඳාම ● භාණ්ඩ හුවමාරුව ●විදේශ වෙළඳ සංවිධාන මුදල් (ලකුණු 05)

3. (i) පණ්ඩු කාශ්‍යප/දේවානම් පියතිස්ස/ දුටුගැමුණු.
(ii) ඉඩම් භුක්තිය.
වෙළඳාම.
කෘෂිකර්ම සම්බන්ධ/ අපරාධ නීති.
(iii) අදාළ නිවැරදි පිළිතුරට ලකුණු දෙන්න.

4. (i) සිරිත්, විරිත්/ඇදහිලි විශ්වාස/ ජන ගී.
(ii) පැරණි අනුරාධපුර නගර.
පැරණි පොළොන්නරු නගර.
සීගිරිය.
දඹුළු විහාරය.
(iii) අතීත මුතුන් මිත්තන්ගේ නිර්මාණශීලිත්වය.
දැනුම/ යහපත් ආකල්ප.
අපේ රටේ ආවේණික සංස්කෘතිය ලොවට පෙන්වීම
පැරණි ඉංජිනේරු ශිල්පය තාක්ෂණය.

5. (i) ආර්ථිකය / ආරක්ෂාව.
(ii) දළඳා සිරිත/ සිංහල බෝධි වංශය/ අනාගත වංශය.
(iii) දෙවන පරාක්‍රමබාහු රජු.
(i) කාලිංග මාඝ ආක්‍රමණය.
(ii) චන්ද්‍ර භානු ආක්‍රමණය.

6. (i) දිවීම/කවපෙත්ත/ බර ඉසිලීම/මල්ලව පොර.
(ii) සොක්‍රටීස්/ ප්ලේටෝ/ ඇරිස්ටෝටල්.
(iii) රෝම ශිෂ්ටාචාර.
(i) නගර නිර්මාණ.
(ii) සැලසුම් නගර.
සුඛෝපබෝගී නිවාස.
මහල් නිවාස.
ජල පහසුකම්.
මාර්ග ජාලා.

(iii) කිතු දහම.
රෝම.
ලතින් භාෂාව.
රෝම ගෘහ නිර්මාණ ශිල්ප.